චක්‍රලේඛ අංක. 98/03

98/04/08

(42)


ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව
காணி ஆணையாளர் திணைக்களம்
LAND COMMISSIONER'S DEPARTMENT
අංක 7, ග්‍රෙගරි මාවත, කොළඹ 7-00700
இல. 7, கிரகரிஸ் மாவத்தை, கொழும்பு 7-00700
No. 7, Gregory's Avenue, Colombo 7-00700


මගේ අංකය } 5/4/පොදු(11).

ඔබේ අංකය }

දුරකථන } 684051

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත.

19 98.03.04

ඉඩම් කො... / දකුණු පළාත් ස... / 1998-4-1 / ගාල්ල

### 1979 අංක 43 දරණ ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පණත යටතේ බෙදා දී ඇති ඉඩම් වලට නියදන සාධන පත්‍ර නිකුත් කිරීම

ඉහත කරුණට අදාලව කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද 1997.11.25 දිනැති කැබිනට් මණ්ඩල සංදේශය සම්බන්ධව නීතිපතිවරයා විසින් යෝජනා කර ඇති ක්‍රියා මාර්ගය අනුව කටයුතු කිරීමට 1997.12.10 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කර ඇත.

ඒ අනුව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂමට අයත් ඉඩමක් ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පණතේ 2(1) වගන්තිය යටතේ රජයට පවරා ගැනීමේදී රජය විසින් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසමට වන්දි මුදලක් ගෙවීම අවශ්‍ය නොවේ.

යම් හෙයකින් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම විසින් යම් ඉඩමක් පවරා ගත් අවස්ථාවේ එහි මුල් අයිතිකරුට වන්දි මුදල් ගෙවා නොතිබුනි නම් පමණක් එම ඉඩම සඳහා රජය විසින් භාණ්ඩාගාර අනුමැතිය මත ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම වෙත අදාල වන්දි මුදල ගෙවීමට කටයුතු කළ යුතු වේ.

ඉහත සඳහන් උපදෙස් පරිදි ඉඩම් ප්‍රදාන ( විශේෂ විධිවිධාන) පණතට අයත් ඉඩම් සම්බන්ධව ඉදිරි කටයුතු කරන ලෙස දන්වා සිටිමි.

ඒ අනුව ඔබ කොට්ඨාශයේ ඉඩම් ප්‍රදාන ( විශේෂ විධිවිධාන ) පණත යටතේ බෙදා දී ඇති ඉඩම්කට අදාලව තවමත් 2(1) වගන්තිය යටතේ ගැසට් නිවේදන පළ කිරීම සම්බන්ධ විස්තර මා වෙත එවා නොමැති නම්, එම විස්තර ද ඉතා ඉක්මනින් මා වෙත එවීමට කටයුතු කරන්න.

ඩබ්. ජේ. ජේ. කුමාරසිරි
ඉඩම් කොමසාරිස්.

පිටපත්:-

1. සියළුම දිසාපති/ දිසා ලේකම්,
2. සියළුම පළාත් ඉඩම් කොමසාරිස්වරුන්.

ප/03.